ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව
இலங்கை சட்ட உதவி ஆணைக்குழு
Legal Aid Commission of Sri Lanka

# මානව අයිතිවාසිකම්



USAID/CORE ව්‍යාපෘතියේ ආධාර මත සකසන ලදී

USAID
FROM THE AMERICAN PEOPLE

## වගකීමෙන් මිදීමේ ප්‍රකාශය

"අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු නියෝජිතායතනයේ (USAID) හරහා ලැබෙන ඇමරිකානු ජනතාවගේ පරිත්‍යාගශීලිත්වය මත මෙම ප්‍රකාශනය එළි දැක්වේ. මෙම වාර්තාවේ අන්තර්ගතය පිළිබඳ සම්පූර්ණ වගකීම ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව සතුවන අතර එමඟින් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු නියෝජිතායතනයෙහි (USAID) හෝ ඇමෙරිකානු එක්සත් ජනපද රජයේ මතය කිසිඳු අයුරකින් පිළිබිඹු නොවන බව සැලකුව මැනව."

Ministry of Justice

# මානව අයිතිවාසිකම්

**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව**

සම්පාදනය
නීතිඥ ආර්. නවෝදයම්, LLB

*copyrights@ Legal Aid Commission of Sri Lanka*



## සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව (1978) අංක (27)දරණ පනත මඟින් ස්ථාපිත කරන ලදී. වරප්‍රසාද නොලත් ප්‍රජාවන්ට නොමිලේ නීතිමය උපදෙස් ලබාදෙන අරමුණින් ව්‍යාවස්ථාපිත නීති ආයතනයක් ලෙස කොමිසම මානව හිමිකම්, ළමා අයිතිවාසිකම්, කාන්තා අයිතිවාසිකම්, වැඩිහිටි අයිතිවාසිකම්, පවුල් නීතිය, කම්කරු නීතිය, වැනි ක්ෂේත්‍ර කිහිපයක නීතිමය සහය ලබාදෙයි. හැකිතාක් සිවිල් නීතියේ සහන සැලසීමට, දැනුවත් කිරීමට සහ මඟපෙන්වීම සඳහා අපගේ ආධාර පුළුල් කර ඇත්තෙමු.

අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන බොහෝ සංවිධාන තිබුනත්, ශ්‍රී ලංකා රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස නීතිමය කටයුතු කරගෙන යාමට නීතිමය බලය ඇති එකම ආයතනය නීති ආධාර කොමිෂන් සභාවයි.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව ආදායම, සමාජ තත්වය, ජාතිය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය හෝ වයස නොසලකා උපදෙස් ලබා දෙයි. පීඩිත සහ අවදානමට ලක්ව ඇති දිවයින පුරා විසිරී සිටින දහස් ගනනකට නීතියේ පිහිට සමානව ලබාදීම ගැන අප ආඩම්බර වෙමු.

මෙම පොත් එකතුව ප්‍රජාවන්ට, නිලධාරීන්ට සහ පුද්ගලයන්ට නීතිය අවබෝධ කර ගැනීමටත්, ඔවුන් ගේ අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳව දැනුවත් වීමටත් අත්වැලක් වේ. තව දුරටත් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ නිලධාරීන් මඟින් අවශ්‍ය නීතිමය සහය සහ උපදෙස් ලබා ගත හැකි බව දැනුවත් වීමට මෙය උපකාර වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

**ජනාධිපති නීතිඥ රොහාන් සහබන්දු**
සභාපති, ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

# ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව (1978) අංක (27) දරණ පනත මඟින් ස්ථාපිත කරන ලදී. එමඟින් අවදානමට ලක් විය හැකි, අඟහිඟකම් ඇති ප්‍රජාවන්ට, සමාජ තත්වයෙන් හෝ ආර්ථික තත්වයෙන් හෝ ස්ත්‍රී පුරුෂ භාවය අනුව යුක්තිය සඳහා ප්‍රවේශ වීම සීමා වී ඇති පුද්ගලයින්ට නීති ආධාර සැපයීම උදෙසා පිහිටුවන ලද්දකි.

තිරසාරභාවය හා ස්ථාවරත්වය උදෙසා නීතිමය ආධාර සපයන වෙනත් ආයතන හා සංවිධාන අතරින් මෙම කොමිසන් සභාව ප්‍රමුඛස්ථානයක් ගනී.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව දිවයින පුරා පළාත් 9 ක මධ්‍යස්ථාන 84 පවත්වා ගෙනයන අතර දැනුවත් කිරීම සහ ආදයම් සීමාවකින් තොරව සියලුම දෙනාට නීති උපදෙස් සම්පාදන ලබා දීම පිළිබඳව අවබෝධ කිරීම් සිදුකරයි. එහි ස්ථිර නීතිඥයින් 120ට අධික සංඛ්‍යාවක් සහ නිදහස් වෘත්තීක නීතිඥයන් 1000 ට අධික සංඛ්‍යාවක් කාර්යයේ නිරත වේ.

"කොමිෂන් සභාවේ දැක්ම වන්නේ සියලුම ශ්‍රී ලාංකිකයන්ට යුක්තිය සඳහා සමාන ප්‍රවේශක් තිබිය යුතු සමාජයක් නිර්මාණය කිරීමයි." මෙම අරමුණ සාක්ශාත්කර ගැනීම සඳහා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව බොහෝ ව්‍යාපෘති සිදුකර ඇත.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ මෙහෙවර වන්නේ රටේ නීතිමය පිහිට ලැබිය යුතු පුද්ගලයන්ට පිහිට ආධාර ලබාදීම බව පනතේ සඳහන් වේ.

# අපගේ දැක්ම

### යුක්තියට සම ප්‍රවේශයක්

ශ්‍රී ලාංකිකයින්ට ඔවුන්ගේ ආර්ථික හෝ සමාජ තත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, කුලය, ආගම හෝ ජාතිකත්වය හෝ ආබාධිතභාවය නොසලකා යුක්තිය සඳහා සමාන ප්‍රවේශයක් ඇති සමාජයක් නිර්මාණය කිරීමයි.

# පටුන


| | පිටු අංක |
|---|---|
| මානව අයිතිවාසිකම් යනු මොනවාද? | 01 |
| මානව අයිතිවාසිකම් නීතියේ ඉතිහාසය | 02 |
| මානව අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතීන් | 03 |
| මෙම නිතීන් අපට අදාළ වන්නේ කෙසේද? | 04 |
| ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ආරක්‍ෂා කර ඇති මානව අයිතිවාසිකම් මොනවාද? | 05 |
| මානව අයිතිවාසිකම් නීතියට පනවා ඇති සීමාකිරීම් මොනවද? | 09 |
| මානව හිමිකම් උල්ලංඝනය වන්නේ කෙසේද? | 10 |
| යම් අයෙකුට ලබා ගත හැකි පිළියම් මොනවාද? | 11 |
| උපකාර කළ හැක්කේ කා හටද? | 12 |
| නීති අධාර කොමිෂන් සභාව උපකාර කරන්නේ කෙසේද? | 14 |
| මානව හිමිකම් කඩ වීමේ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේදි භාවිතා වන ආකෘති පත්‍ර. | 15 |
| LAC මධ්‍යස්ථාන පිහිටි ස්ථාන | 17 |



## මානව අයිතිවාසිකම් යනු මොනවාද?

> “ජනවාර්ගිකත්වය, වර්ණය, ජාතිය, ලිංගිකත්වය, සමාජ තත්වය හෝ උපන් ස්ථානය නොසලකා සියලු මිනිසුන් හට භුක්ති විඳිය හැකි අයිතිවාසිකම් සමූහයකි.”

මානව අයිතිවාසිකම් යනු මනුෂ්‍ය වර්ගයාගේ ස්වභාවික පැවැත්මට, අඛන්ඩතාවයට හා මනුෂ්‍යත්වයට අත්‍යාවශ්‍ය අයිතිවාසිකම් සමූහයකි. මෙම අයිතිවාසිකම් කවුරුන්හටවත් නිර්මාණය කල නොහැකි අතර මේවා සෑම මනුෂ්‍යයෙකුටම තම උපතේදීම උරුම වන බව බොහෝ දෙනාගේ මතයයි.

මනුෂ්‍ය වර්ගයාගේ අඛන්ඩතාවයට හා තිරසාර--භාවයට මෙම අයිතීන් වඩාත් ඉවහල් වේ. ඒ අනුව මෙම අයිතිවාසිකම් සියල්ල සෑම මනුෂ්‍යයෙකුම ජාතිය, ආගම, පැහැය, ස්ත්‍රී පුරුෂ භාවය ආදී වූ කිසිදු වෙනසකින් තොරව භුක්ති විඳිනු ලබයි.

## මානව අයිතිවාසිකම් නීතියේ ඉතිහාසය

මානව අයිතිවාසිකම් සමාජයේ යහ පැවත්මට අත්‍යාවශ්‍ය සාධකයක් වේ. බුද්ධාගම, කතෝලික ආගම, ඉස්ලාම් ධර්මය ආදී සියළු ආගම් මිනිස් ඝාතනය, ස්ත්‍රී දූෂණය, සොරකම හා අනෙකුත් සියළු ශාරීරික හා මානසික පීඩන හෙලා දකියි. තම පුත්‍රයා ගව පැටවෙකු ඝාතනය කිරීම නිසා ඔහුට මරණ දණ්ඩනය පැනවූ රජෙකු ගැන අප මහාවංශයේ අසා ඇත. අතීතයේදී සතුන්ගේද අයිතිවාසිකම් ආරක්ෂා කරනු ලැබූ ආකාරයට මෙය කදිම නිදසුනකි.

සමාජය ක්‍රමයෙන් සංකීරණ වෙත්ම මෙවැනි සබඳකම් ගිලිහී ගියේය.මෙවැනි පසුබිමක් මත නීතියේ ආරක්ෂාව වුවමනා වූ අතර බටහිර ලෝකයේ නීතිමය ආරක්ෂාව සහිත නූතන මානය අයිතිවාසිකම් පිළිබඳව මිනිසා සිතන්නට විය.

මානව අයිතිවාසිකම් පිළිබඳ ඉතිහාසයේ වඩාත් වැදගත්ම සංදිස්ථානය වන්නේ ජෝන් රජු හා බ්‍රිතාන්‍යයේ පාර්ලිමේන්තුව අතර ඇතිවූ බල අරගලයේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවූ මැග්නා කාටර් ගිවිසුමයි. මෙම ගිවිසුම මඟින් නීත්‍යානුකූල නොවන ලෙස පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම, රඳවාතබා ගැනීම,පිටුවහල් කිරීම පිළිබඳව තිබූ අසීමිත බලතල සීමා කරන ලදී. තවද, මෙම ගිවිසුම පුද්ගලයින්ගේ සිවිල් අයිතීන්ද තහවුරු කරන ලදී. එසේම ඇමරිකානු විප්ලවයද මානව අයිතිවාසිකම් පිළිබඳ ඉතිහාසයේ වැදගත් සංදිස්ථානයකි.

ඇමරිකානු පරිපාලනය වහල් සේවයේ සිට ස්වාධීන සේවයට පරිවර්තනය වීම වෙනත් රටවල්වලටද වහල් සේවයෙන් මිදීමට උදාහරණයක් පනවන ලද්. ප්‍රංශ ප්‍රකාශනය මඟින් ප්‍රංශ රාජාණ්ඩුව බිඳ වැටීම, ටිසාර් පාලනයට එරෙහි රුසියානු විප්ලවය මඟින් රුසියානු ව්‍යවස්ථාව බිඳ වැටීමද මෙයට උදාහරණ ලෙස දැක්විය හැක.



# මානව අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතීන්

මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය

වර්ෂ 1948 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කරන ලදී. මිනිස් ජීවිතයේ ගෞරවය හා මිනිසාගේ පැවත්ම සඳහා අත්‍යවශ්‍ය මූලික අයිතිවාසිකම් පිළිබඳව මෙම ප්‍රකාශනයේ දැක්වෙයි. මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය මිනිස් අයිතිවාසිකම් පිළිබඳ වර්තමානයේ පවතින අන්තර්ජාතික නීතියයි. කිසියම් රටක් විසින් මෙම සම්මුතිය අනුමත කරන ලද අවස්ථාවකදී මෙම ප්‍රකාශනය එම රටෙහි නීතියක් බවට පත්වේ.බොහෝ රටවල ව්‍යවස්ථාවල ඇතුළත් කර ඇති මූලික අයිතිවාසිකම්වල මූලය මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය වේ.

ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය

මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයට අමතරව ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතීන් පිළිබඳ මෙන්ම සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතීන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සම්මත කර ඇත.

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය

ඒ අනුව මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය, ඉහත දක්වන ලද ජාත්‍යන්තර සම්මුතීන් හා ඒවාට අනුබද්ධ වෙනත් සම්මුතීන් මානව අයිතිවාසිකම් පිළිබඳ මූලික නීතිය ලෙස දැක්විය හැක.

## මෙම නීතීන් අපට අදාළ වන්නේ කෙසේද?

ශ්‍රී ලංකා රජය විසින් වර්ෂ 1980 දී හා 1997 දී සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය හා එහි විකල්ප සම්මුතීන් අත්සන් කරන ලදී.ඒ අනුව පුද්ගලයෙකුගේ මානව අයිතිවාසිකම් කඩ වන ලද අවස්ථාවකදී ඔහුට ජිනීවා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ආයාචනා කළ හැක.එය මෙම සම්මුතියේ විශේෂ ලක්ෂණයකි.කෙසේවෙතත් ජාත්‍යන්තර සම්මුතියක් හුදු අත්සන් කිරීමෙන් පමණක් රටක බලපැවැත්වෙන නීතියක් බවට නොසැළකේ.

> "**සිංඝරාසා එදිරිව නීතිපති** නඩුවේදි ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය වුයේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය ශ්‍රී ලංකාවේ බලපැවැත්වෙන නීතියක් නොවන බවයි."

මෙම තීරණයෙන් අසතුටු වූ පෙත්සම්කරු වන සිංඝරාසා සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ පළවන විකල්ප සම්මුතිය මඟින් ජිනීවා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ආයාචනා කර ඇත.

ජිනීවා මානව හිමිකම් කොමිෂන් සභාව මෙම පැමිණිල්ල විභාගයට ගෙන දක්වන ලද්දේ සාධාරණ විභාගයක් කර නොමැති බැවින් පෙත්සම්කරුව නිදහස් කරන ලෙස හෝ මෙම නඩුව නැවත විභාග කරන ලෙසයි. කෙසේවෙතත් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ජිනීවා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කිසිදු බලතලයක් ලබාදී නොමැති බැවින් මෙම නිර්දේශ ස්ථාපනය නොකරන ලදී.

**මෙම සිංඝරාසා නඩුවෙන් පසුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය රටෙහි බලපැවත්වෙන නීතියක් බවට පත්කිරීම සඳහා සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත ස්ථාපිත කරන ලදී. (2007 අංක 56 දරණ පනත)**

සෑම රටකම මානව අයිතිවාසිකම් ආරක්‍ෂා කර ගැනීම සඳහා බලය ඇති අධිකරණ පද්ධතියක් තිබිය යුතුය.තවද මානව අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීම සහ එම අයිතිවාසිකම් කඩ වු විටකදී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම සඳහා ආයතනයන්ද ස්ථාපිත කළ යුතුව ඇත. මානව අයිතිවාසිකම් ආරක්‍ෂා කර ගැනීම පිළිබඳ නීතිය හා එම අයිතිවාසිකම්කඩ වු විටකදී ගත යුතු නෛතික හා අධිකරණ ක්‍රියාමාර්ග පිළිබඳ පුරවැසියන් දැනුවත් කිරීමේ වගකීමක් නීතීඥවරුන් සතුව ඇත.

# ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ආරක්ෂා කර ඇති මානව අයිතිවාසිකම් මොනවාද?

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මානව හිමිකම් ඇතුලත් වන පරිදි ක්‍රමානුකූලව දක්වා ඇත. භාෂා අයිතිවාසිකම් සම්බන්ධයෙන් වගන්ති 10, 11, 12, 13, 14, 15, තුළ සහ 126 වගන්තියෙහි III වන පරිච්ඡේදයේ මෙම වගන්ති 18 සිට 25 දක්වා ඇතුලත් වේ.

## සමානාත්මතාවය

### 10 වන ව්‍යවස්ථාව

“සෑම තැනැත්තෙකුටම තමන්ට අභිමත ආගමක් ඇදහීමේ හෝ වැළඳ ගැනීමේ නිදහසද, විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස ද ඇතුළුව සිතීමේ නිදහසට, හෘදය සාක්ෂියේ නිදහසට සහ ආගමික නිදහසට හිමිකම් ඇත්තේය.

### 11 වන ව්‍යවස්ථාව

“කිසිම තැනැත්තකු වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය.

### 12(1) වන ව්‍යවස්ථාව

“නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද, සර්ව සාධාරණ විය යුත්තේ ය.

### 12 (2) වන ව්‍යවස්ථාව

“කිසිම පුරවැසියෙකුජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේය.

කෙසේ වෙතත්, රාජ්‍ය සේවය සඳහා භාෂා අවශ්‍යතාවය සහ කාන්තා, ළමා සහ ආබාධ සහිත පුද්ගලයන්ගේ දියුණුව සම්බන්ධයෙන් ව්‍යාතිරේකව පවති.

**14 (1) වන ව්‍යවස්ථාව**

"(1) සෑම පුරවැසියකුටම -
(අ) භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළකිරීමේ නිදහසට;
(ආ) සාමකාමීව රැස්වීමේ නිදහසට;
(ඇ) සමාගමයේ නිදහසට;
(ඈ) වෘත්තීය සමිති පිහිටුවීමේ සහ වෘත්තීය සමිතිවලට බැඳීමේ නිදහසට;
(ඉ) හුදකලාව හෝ අන් අය සමග, ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව තම ආගම හෝ විශ්වාසය ඇදහීමෙන්, පිළිපැදීමෙන්, ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහසට;
(ඊ) හුදකලාව හෝ අන් අය සමග හෝ ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමේ වැඩි දියුණු කිරීමේ නිදහසට සහ ස්වකීය භාෂාව භාවිත කිරීමේ නිදහසට;
(උ) හුදකලාව හෝ අන් අය සමග යම් නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියුක්ත වීමේ නිදහසට;
(ඌ) ශ්‍රී ලංකාව තුළනිදහස්ව හාතම අභිමතය පරිදිඕනෑම ස්ථානයකට යාමට, ඒමට හෝ වාසය කිරීමට ඇති නිදහසට; සහ
(ඒ) ශ්‍රී ලංකාවට පෙරළා පැමිණීමේ නිදහසට හිමිකම ඇත්තේ ය.

## නියමිත ක්‍රියාවලියට අදාළ අයිතිවාසිකම්

**13 (1) වන ව්‍යවස්ථාව**

"නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේය. යම් තැනැත්තෙකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මත ද ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුත්තේය.

**13 (2) වන ව්‍යවස්ථාව**

"අත් අඩංගුවෙහි තබා ගනු ලැබූ හෝ රඳවා තබා ගනු ලැබූ හෝ අන්‍යාකාරයකින් පෞද්ගලික නිදහස අහිමි කරනු ලැබූ හෝ සෑම තැනැත්තෙකුම නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටිය අනුව ආසන්නතම නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයා ඉදිරියට ගෙන යායුතුය.

**13 (5) වන ව්‍යවස්ථාව**

"වරදකරු යැයි ඔප්පු කරනු ලබන තෙක් සෑම තැනැත්තෙකුම නිර්දෝෂී යැයි පූර්වානුමාන කළ යුත්තේ ය.

**13 (6) වන ව්‍යවස්ථාව**

"යම් ක්‍රියාවක් කළ හෝ යම් නොකර හැරීමක් සිදු වූ අවස්ථාවේ දී ඒ ක්‍රියාව හෝ නොකර හැරීම වරදක් නොවේ නම් ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් කිසිම තැනැත්තෙකු වරදකට වරදකරුවකු නොවිය යුත්තේ ය.

## කෲරත්වයට එරෙහි ආරක්ෂාව

### 13 (3) වන ව්‍යවස්ථාව

"වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තෙකුට විරුද්ධව චෝදනා නගනු ලැබ ඇත්තේ ද, ඒ තැනැත්තාට, නිසි අධිකරණයක් විසින් පවත්වනු ලබන සාධාරණ නඩු විභාගයකදී පෞද්ගලිකවම හෝ නීතිඥවරයකු මගින් හෝ කරුණු ක්‍රියා සිටීමට හිමිකම් ඇත්තේය.

## ජීවිත අවදානම

### 13 (4) වන ව්‍යවස්ථාව

"නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව නිසි අධිකරණයක් විසින් කරනු ලැබූ ආඥාවක් අනුව මිස, කිසිම තැනැත්තෙකු මරණීය දණ්ඩනයට යටත් කිරීම හෝ කිසිම තැනැත්තෙකු බන්ධනාගාරගත කිරීම හෝ නොකළ යුත්තේ ය.

## මානව හිමිකම් සඳහා ව්‍යතිරේකය

### 15 වන ව්‍යවස්ථාව

"මෙසේ ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ ද, ක්‍රියාත්මක විය හැක්කේ ද, රාජ්‍ය ආරක්ෂාව ද, රටේ යථා පැවැත්ම ද, තහවුරු කිරීම පිණිසත්, මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිස නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට පමණක් යටත්වය.

## භාෂා අයිතිවාසිකම්

### 18 (1) වන ව්‍යවස්ථාව

"ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාව සිංහල භාෂාව වේ.

### 18 (2) වන ව්‍යවස්ථාව

"දෙමළ භාෂාව ද රාජ්‍ය භාෂාවකි.

## මානව හිමිකම් පිළිබඳ අධිකාරිය

### 126 (1) වන ව්‍යවස්ථාව

"මූලික අයිතිවාසිකමක් නැතහොත් භාෂා අයිතිවාසිකමක් යම් විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් කඩ කිරීමට අත්‍යාසන්නව පැවතීම හා සම්බන්ධ කවර වූ හෝ ප්‍රශ්නයක් විභාග කොට තීරණය කිරීමේ තනි හා අනන්‍ය අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ඇත්තේ ය.

### 17 වන ව්‍යවස්ථාව

"යම් තැනැත්තෙකුට හිමි වන යම් මූලික අයිතිවාසිකමක් යම් විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් මගින් උල්ලංඝනය කර තිබීම හෝ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්නව තිබීම හෝ ඒ සම්බන්ධයෙන් 126 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති පරිදි ශ්‍රේෂ්ඨාධිකරණය ඉල්ලීමක් කිරීමට ඒ තැනැත්තාට හිමිකම් ඇත්තේ ය.

### 126 (2) වන ව්‍යවස්ථාව

"එසේ මූලික අයිතිවාසිකමක් නැතහොත් භාෂා අයිතිවාසිකමක් යම් විධායක ක්‍රියාවක් මගින් හෝ පරිපාලන ක්‍රියාවක් මගින් කඩ කොට ඇති බවට හෝ කඩ කිරීමට අත්‍යාසන්නව පවතින බවට යම් තැනැත්තකු විසින් දෝෂාරෝපණයක් කරනු ලබන අවස්ථාවක ඔහු විසින්ම නැතහොත් ඔහු වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයකුගේ මාර්ගයෙන්, එතැන් පටන් මාසයක් ඇතුළත, එම කඩ කිරීමෙන් සහනයක් හෝ පිහිටක් ලබා දෙන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අයැද සිටින ඉල්ලීමක් කළ හැකිය.

ඒ අයුරින් මෙම නීතීන් තුළ සමානාත්මතාවයට ඇති අයිතිය, වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත වෙනස්කමකට ලක් නොවීමට ඇති අයිතිය, ජීවත් වීමට ඇති අයිතිය, වහල් බවින් මිදීමට ඇති අයිතිය, වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොවීමට ඇති අයිතිය, නෛතික රැකවරණය ලැබීමට ඇති අයිතිය, නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූල නොවන ලෙසින් අත්අඩංගුවට ලක්වීමෙන් මිදීමට ඇති අයිතිය, අධිකරණයේ පෙන් සිටීමට ඇති අයිතිය, තමා කැමති ජාතියක් දැරීමට ඇති අයිතිය, තමාගේ රටට නැවත ඒමට ඇති අයිතිය, විවාහ වී පවුලක් ඇති කර ගැන්මට ඇති අයිතිය, දේපළ භුක්ති විඳීමට ඇති අයිතිය, නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියුක්ත වීමේ අයිතිය සහ ආහාර පාන, නිවාස, සෞඛ්‍ය සේවාවන් ලැබීමට ඇති අයිතිය ඇතුළත් වේ.

# මානව අයිතිවාසිකම් නීතියට පනවා ඇති සීමාකිරීම් මොනවද?

ශ්‍රී ලංකාවේ 1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳව ඇතුළත් නොවූවත් පුරවැසියන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා 29(2) වන ව්‍යවස්ථාව මඟින් උත්සාහ කර ඇත. එම ව්‍යවස්ථාව මගින් කිසිදු ආගමකට හෝ ජාතියකට එරෙහිව නීති පැනවීම තහනම් කර ඇත.

1972 ව්‍යවස්ථාවෙහි මූලික අයිතිවාසිකම් පිළිබඳව පරිච්ඡේදයක් ඇතුලත් වුවත් එම අයිතියක් කඩ වූ අවස්ථාවකදී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව යාන්ත්‍රණයක් ඇතුළත් නොවන ලදී. එබැවින් එම ව්‍යවස්ථාව උපයෝගී කර ගනිමින් පුරවැසියන්ට නීතියෙන් සහනයක් ලබා ගැනීමට ඇති හැකියාව අල්ප විය.

- ඒවා අර්ථ නිරූපණයට යටත් වේ
- සමහර අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලිව දක්වා නැත
- උල්ලංඝනය කරන්නන් සඳහා නීතියේ සඳහන් පිළියම් නොමැත

# මානව හිමිකම් උල්ලංඝනය වන්නේ කෙසේද?

## මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වී ඇති බව දැනගන්නේ කෙසේද?

පොලිසියේ උසස් නිලධාරියෙක් විසින් තවත් නිලධාරීන් දෙදෙනෙකු සමග මත්කුඩු සොයා ගැනීමේ මෙහෙයුමක් දියත් කරන ලදී. මෙහෙයුම අවසාන වී ඔවුන් ජීප් රථයකින් පොලිස් ස්ථානය බලා පිටත්ව යන අතර මඟදී ජීප් රථය ආපදාවට ලක්වීම නිසා ඔවුන් පා ගමනින් පොලිස් ස්ථානය වෙත ගමන් කරන ලදි. මෙහෙදී කනිශ්ඨ නිළධාරිවරයා ජ්‍යේෂ්ඨ නිළධාරියාගෙන් අසා සිටියේ නිළධාරීතුමනි මා මාගේ මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බව දැනගන්නේ කුමන අවස්ථාවෙදීද යන්නයි.

ජ්‍යේෂ්ඨ නිළධාරියා සිනාසි එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්නේ කෙසේදැයි සිතුවේය. ඔවුන් යන අතරමගදී විශාල ගංගාවක් පසු කිරීමට තිබුණි.

ඔවුන් ගඟින් එතෙර වීමට පටන් ගත්හ. ජ්‍යේෂ්ඨ නිලධාරියා එවිට අසා සිටියේ ඔබට දැනගැනීමට අවශ්‍ය වූයේ ඔබගේ මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බව දැනගන්නේ කෙසේද යන්න නේද? කනිශ්ඨ නිළධාරියා ඔහුගේ හිස වැනුවේය. එකවරම ජ්‍යේෂ්ඨ නිළධාරියා කනිශ්ඨ නිළධාරියාව ගඟට තල්ලු කළේය.මෙම හදිසි සිදුවීමෙන් කනිශ්ඨ නිළධාරියා ව්‍යාකූල විය. ඔහු කිසිදු අමුත්තක් නොපෙන්වූ නමුත් තැතිගැන්වී සිටියේය.

ඔවුන් ගඟේ මැදට ලඟා වෙත්ම ජ්‍යේෂ්ඨ නිළධාරියා කනිශ්ඨ නිළධාරියාගේ හිස වතුරේ ඔබ්බවා තත්පර 15 ක් එසේ සිටියේය. වතුරින් ගොඩට ආ පසු නිළධාරියා මෙසේ පවසා සිටියේය.ඔබ මාව වතුරට තල්ලු කළ විට මා බියට පත් වුනෙමි මා හට හුස්ම ගැනීමටද අපහසු විය. මම මාගේ ජීවිතයට සටන් කරන්නාක් මෙන් දැනුණා. එවිට මාගේ මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බව මට වැටහුනි.

පුද්ගලයෙකුට කිසිදු බියකින් හා බිය ගැන්වීමකින් තොරව ජීවත් වීමට නොහැකි විට මූලික අයිතිවාසිකම් කඩවේ.

## යම් අයෙකුට ලබා ගත හැකි පිළියම් මොනවාද?

පහත දැක්වෙන කුමන හෝ මූලික අයිතිවාසිකමක් යම් විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් මඟින් කඩ කොට ඇති හෝ කඩ කිරීමට අත්‍යාසන්නව පවතින අවස්ථාවක එකී සිදුවීමෙන් මාසයක් තුළ ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීම සඳහා නීති අධාර කොමිෂන් සභාවේ ඕනෑම ශාඛාවක් වෙත ලියාපදිංචි තැපෑල මගින් ලිපියක් යොමු කළ යුතුය.

- ආගමික නිදහස ආරක්‍ෂා කිරීම
- නීත්‍යානුකූල රැකියාවක හෝ ව්‍යවසායක නිරත වීම වැළැක්වීම
- නීතිය ඉදිරියේ සමානාත්මතාවයෙන් නොසැළකීම
- නීතිවිරෝධී ලෙස අත්අඩංගුවට ගැනීම
- නීතිවිරෝධී ලෙස අත්අඩංගුවේ තබා ගැනීම
- කෲර, වධ හිංසනය
- අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම
- උසාවි නියෝගයකින් තොරව දඬුවම් පැනවීම
- අතීතයට බලපාන ලෙස නීති පැනවීම

තවද එම අවස්ථාවේදීම මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිල්ලක් කළ යුතුය. එමඟින් එම ක්‍රියා පටිපාටිය සඳහා වැය වන කාලය යම් පමණකින් අවම කරගත හැක.

දුරකථන - 0112505580<br>
ලිපිනය - මානව හිමිකම් කොමිෂන් සභාව<br>
අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත,<br>
කොළඹ 04

## උපකාර කළ හැක්කේ කා හටද?

### ඔම්බුඩ්ස්මන් / පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය.

වර්ෂ 1996 අංක 21 දරණ මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යාල ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගරවල ආරම්භ කර ඇත. එහි ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත්තේ අංක 108, බාර්න්ස් පෙදෙස, කොළඹ 07 යන ස්ථානයේය. මූලික අයිතිවාසිකමක් කඩ වී ඇත්නම් හෝ කඩ වීමට යන අවස්ථාවක නම් එසේ අයිතිවාසිකම් කඩ වී ඇති තැනත්තාට හෝ ඔහුගේ නීතිඥවරයාට මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කළ හැකිය. මේ අයුරින් පැමිණිල්ලක් සිදු කිරීමට විශේෂ අවශ්‍යතාවයක් නොමැති අතර කොමිෂන් සභාව විසින් දෙන ලද ආකෘති පත්‍රය පිරවීම ප්‍රමාණවත් වේ.

මූලික අයිතිවාසිකමක් නැතහොත් භාෂා අයිතිවාසිකමක් කඩ වී ඇති අවස්ථාවක මානව හිමිකම් කොමිෂන් සභාවට කරනු ලබන පැමිණිල්ලක් එම කඩ වීම සිදුවී මාස 03ක් ඇතුළත ගොනු කළ යුතුය. මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ දුරකථන අංක,011 694925 සහ 0112 685980

ඔම්බුඩ්ස්මන් යන තනතුර ස්ථාපිත කරන ලද්දේ වර්ෂ 1981 අංක 17 දරණ පනතින් වන අතර එය වර්ෂ 1994 අංක 26 දරණ පනතින් සංශෝධනය කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන මූලික අයිතිවාසිකමක් හෝ භාෂා අයිතිවාසිකමක් හෝ මොනයම් අයිතිවාසිකම්ක කඩ වන ලද අවස්ථාවක ඔම්බුඩ්ස්මන් වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැක. එවිට ඔබුඩ්ස්මන් එම පැමිණිල්ල අදාළ දෙපාර්තමේන්තුව සඳහා වාර්තාවක් ඉදිරිපත් කිරීමට යොමු කරයි.එම වාර්තාවට අනුව යම් කඩවීමක් ඇතිනම් යොජනාවන් ඉදිරිපත් කරනු ලබේ. පැමිණිලි ඉදිරිපත් කිරීමට නිසැක කාලයක් නොතිබුණත් එම පැමිණිලි සාධාරණ කාලයක් තුළ ඉදිරිපත් කළ යුතුය.

ඔම්බුඩ්ස්මන් කාර්යාලය පිහිටා ඇත්තේ,
පළවන මහල, අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත,
කොළඹ 04 යන ස්ථානයේය.

එසේ මූලික අයිතිවාසිකමක් නැතහොත් භාෂා අයිතිවාසිකම යම් විධායක ක්‍රියාවක් මගින් හෝ පරිපාලන ක්‍රියාවක් මඟින් කඩ කොට ඇති බවට හෝ කඩ කිරීමට අත්‍යාසන්නව පවතින බවට යම් තැනැත්තකු විසින් දෝෂාරෝපණයක් කරනු ලබන අවස්ථාවක 126 (2) ව්‍යවස්ථාව යටතේ ඔහු විසින්ම නැතහොත් ඔහු වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයකුගේ මාර්ගයෙන්, එතැන් පටන් මාසයක් ඇතුළත, එම කඩ කිරීමෙන් සහනයක් හෝ පිහිටක් ලබා දෙන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අයැද සිටින ඉල්ලීමක් කළ හැකිය.

## පාර්ලිමේන්තු තේරීම් කමිටුව

එසේ මූලික අයිතිවාසිකමක් නැතහොත් භාෂා අයිතිවාසිකමක් කඩ කොට ඇති බවට හෝ කඩ කිරීමට අත්‍යාසන්නව පවතින අවස්ථාවක ඒ පිළිබඳව පෙත්සමක් පාර්ලිමේන්තු කථානායක වෙත ඉදිරිපත් කර හැකිය. මෙවැනි පෙත්සමක් භාර දිය යුත්තේ මන්ත්‍රීවරයෙකු මාර්ගයෙන් පමණි. යම් මූලික අයිතිවාසිකමක් කඩ වී ඇති බවට කථානායකවරයා සිතන අවස්ථාවක එම පෙත්සම පාර්ලිමේන්තු තේරීම් කමිටුව වෙත ඉදිරිපත් කරනු ඇත.

## එක්සත් ජාතීන්ගේ සංගමයේ මානව හිමිකම් කවුන්සිලය

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවක් මගින් සෑහීමකට පත් නොවන අයකු වේ නම් ඔහුට ජිනීවා හි පිහිටි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය වෙත අයාචනාවක් ඉදිරිපත් කර හැක. මානව හිමිකම් කවුන්සිලයෙන් දෙනු ලබන තීන්දුවක් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාව බැඳී නැති වුවත් එම තීන්දු සැලකිල්ලට ගැනීමට සදාචාරාත්මක වගකීමක් ශ්‍රී ලංකාවට පැවරී ඇත.

## නීති අධාර කොමිෂන් සභාව

නීති උපදෙස් හෝ නියෝජනය අවශ්‍ය ඕනෑම පුද්ගලයෙකුට නීති අධාර කොමිෂන් සභාවේ සහයෝගය ලබා ගත හැක.

## මානව හිමිකම් කොමිෂන්

කෙසේවෙතත් වර්ෂ 1996 අංක 21 දරණ මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ මනව හිමිකම් කොමිෂන් සභාව වෙත පෙත්සමක් යොමු කර ඇති අයෙකුට ශ්‍රේෂ්ඨාධිකරණය මගින් මෙම කාලසීමාව ලිහිල් කරනු ලැබේ.

මූලික අයිතිවාසිකම් පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති අවස්ථාවක් ගනු ලබන ක්‍රියාමාර්ගය මීට වඩා පුළුල් හා කල්ගත වන ක්‍රියාවලියක් වේ. නමුත් මූලික අයිතිවාසිකම් පෙත්සමක් මානව හිමිකම් කොමිෂන් සභාවට යොමු කර ඇති අවස්ථාවක දැඩි වියදමකින් හෝ කල්ගතවීමකින් තොරව සහනයන් ලබා ගත හැක.

# නීති අධාර කොමිෂන් සභාව උපකාර කරන්නේ කෙසේද?

මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වන අවස්ථාවකදී, ඒ පිළිබඳව වහාම නීති ආධාර කොමිෂන් සභාවටද පිටපතක් ලැබෙන ලෙස අගවිනිසුරුතුමා වෙත ෆැක්ස් මගින් දැනුම් දිය යුතුය.

**නීති ආධාර කොමිෂන් සභාව,**
**මානව අයිතිවාසිකම් අංශය,**
**නො 29, ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය,**
**අලුත්කඩේ, කොළඹ 12,**
**දුරකථන - 011 3070255**
**(ශ්‍රී ලංකාවේ ඕනෑම නීති ආධාර කොමිෂන් සභාවකට).**

ඉන්පසුව නීති ආධාර කොමිෂන් සභාවේ නිලධාරීන් පෙත්සම්කරුව කැඳවා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමෙන් අනතුරුව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරනු ලැබේ.

මූලික අයිතිවාසිකම් පෙත්සම් පිළිබඳව වැදගත්ම කරුණ වන්නේ මෙම පෙත්සම් එසේ අයිතිවාසිකම් කඩ වී දින 30 ක් ඇතුලත ගොනු කළ යුතු වීමයි. යම් කෙනෙකකු අත් අඩංගුවේ පසු වනවානම් ඔහුව නිදහස් කිරීමෙන් දින 30 කට අනතුරුව පෙත්සම ගොනු කළ යුතුය. පෙත්සම යොමු කරනු ලබන්නේ නීති විරෝධී ලෙස පත් කිරීමක් හෝ නෙරපා හැරීමක් පිළිබඳව නම් එකී පත්වීමෙන් දින 30 ක් ඇතුළත නඩුව ගොනු කළ යුතුය.

මූලික අයිතිවාසිකමක් කඩ වී ඇති අවස්ථාවක ඔබගේ මාසික ආදායම රුපියල් 25,000.00 ක මුදලකට වඩා අඩු නම් නීති ආධාර කොමිෂන් සභාවේ නීතිඥවරුන් හරහා නොමිලේ නීති උපදෙස් හා සේවාවන් ලබා ගත හැක.

කෙසේ වෙතත් කුමන ආදයම් මට්ටමක වූ පුද්ගලයෙකුට නීති ආධාර කොමිෂන් සභාව මඟින් නොමිලේ නීති උපදේශන සේවාවන් ලබා ගැනීමට හැකියාව ඇත.

# මානව හිමිකම් කඩ වීමේ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේදී භාවිතා වන ආකෘති පත්‍ර

මෙම අයදුම්පත්‍රය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 සහ 126 ව්‍යවස්ථා යටතේ ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමකි.

පෙත්සම්කරුගේ නම සහ ලිපිනය

**එදිරිව**

Vs

1. 01 වන වගඋත්තරකරුගේ නම සහ ලිපිනය
2. 02 වන වගඋත්තරකරුගේ නම සහ ලිපිනය
3. ................................................................................................
4. ගරු නීතිපති,
   නීතිපති දෙපාර්තමේන්තුව,
   අලුත්කඩේ, කොළඹ 12.

**වග උත්තරකරුවන්**

ගරු අග විනිසුරු හා අනෙකුත් ගරු විනිසුරුතුමන්ලගේ අවධානය පිණිසයි.

වර්ෂ.............. මස.............. වන දින..............

1. පෙත්සම්කරු පිළිබඳව තොරතුරු(පෙත්සම්කරු ශ්‍රී ලාංකිකද? රැකියාව, වයස,විවාහක නම් දරුවන් ගණන)
2. 02 වන හා 03 වන වග උත්තරකරුවන් පිළිබඳව කෙටි විස්තර
3. කඩ වී ඇති මූලික අයිතිවාසිකම පිළිබඳව තොරතුරු

I. අයිතිවාසිකම් කඩ වූ තැනත්තාගේ නම
II. දිනය සහ ස්ථානය
III. අයිතිවාසිකම කඩ වූ ආකාරය
IV. එම අයිතිවාසිකම් කඩ වී ඇත්තේ ව්‍යවස්ථාවේ කුමන ව්‍යවස්ථාව මගින්ද?
V. ඉල්ලුම් කරනු ලබන සහනයන්

..................................

අත්සන

පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම සඳහා පහත ආකෘතිය භාවිතා කළ හැක.
දිනය
ගරු අග විනිසුරු තුමා,
ශ්‍රේෂ්ඨාධිකරණය,
ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය,
අලුත්කඩේ,
කොළඹ 12.

1. පෙත්සම්කරුගේ නම
2. ලිපිනය
3. දුරකථන අංකය
4. රැකියාව හා මාසික ආදායම
5. කඩ වී ඇති මූලික අයිතිවාසිකමේ ස්වභාවය
6. කොන් කිරීමක් ඇතිනම් අදාළ සමාගමේ ප්‍රධානියේ නම හා තනතුර
7. අදාළ පුද්ගලයාව පොලීසියෙන් නිදහස් කරන ලද හෝ නීතිය ඉදිරියට ගෙනෙනු ලැබූ දිනය හා වේලාව
8. රඳවා තබා ගන්නා ලද කාලයේදී යම් හානියක් වූවාද? එම හානියට සහනයක් ලබා ගැනීමට ඒ පිළිබඳව තොරතුරු නීතියේ අවධානයට ලක් වූවාද?
9. ඔබ හිංසනයට ලක් වූවා නම් එවිට ඔබව රෝහල්ගත කරනු ලැබුවාද? එසේ නොමැතිනම් ඔබ වෙනත් ප්‍රතිකාරයකට ලක් වූවාද? එම ප්‍රතිකාරවල විස්තර
10. මෙම මූලික අයිතිවාසිකම් කඩ වීමට සම්බන්ධ ආයතනය කුමක්ද?
11. වගඋත්තරකරුවන්ගේ නම් සහ ලිපිනය
12. මූලික අයිතිවාසිකම කඩ වූ දිනය හෝ ඊට ආසන්න දිනය
13. ඔබ නීති ආධාර පතනවාද?
14. මූලික අයිතිවාසිකම් කඩ වීමට සම්බන්ධ සිදුවීම (අවශ්‍යය නම් වෙනත් කොළයක් භාවිතා කරන්න)

........................
දිනය

........................
අත්සන

නීති අධාර කොමිෂන් සභාව,
මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා වූ ව්‍යාපෘතිය,
අංක 129,ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය,
අලුත්කඩේ,
කොළඹ 12.
දුරකථන - 0112433618/0113070255

# LAC මධ්‍යස්ථාන
# පිහිටි ස්ථාන

| | | | |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 011-2433618 | මන්නාරම | 023-2222045 |
| අක්කරෙයිපත්තු | 067-2279462 | මාරවිල | 032-2254443 |
| අම්පාර | 063-2223495 | මාතලේ | 066-2224828 |
| අනුරාධපුර | 025-2224465 | මාතර | 041-2233815 |
| අත්තනගල්ල | 033-2297020 | මතුගම | 034-2249262 |
| අවිස්සාවේල්ල | 036-2233857 | මාවනැල්ල | 035-2247272 |
| බද්දේගම | 091-2292051 | මිනුවන්ගොඩ | 011-2297790 |
| බදුල්ල | 055-2225759 | මොණරාගල | 055-2276891 |
| බලංගොඩ | 045-2289099 | ගල්කිස්ස | 011-2718708 |
| බලපිටිය | 091-2255753 | මුලතිවු | 021-2290077 |
| බණ්ඩාරවෙල | 057-2224733 | මුයිතූර් | 026-2238777 |
| බත්තරමුල්ල | 011-2877687 | නාවලපිටිය | 054-2224227 |
| මඩකලපුව | 065-2225399 | මීගමුව | 031-2281080 |
| චාවකච්චේරිය | 021-2270882 | නිකවැරටිය | 037-2260203 |
| හලාවත | 032-2222175 | නුගේගොඩ | 011-2809068 |
| දඹුල්ල | 066-2284551 | නුවරඑළිය | 052-2235260 |
| දෙයියන්දර | 041-2268077 | පානදුර | 038-2244822 |
| දෙනියාය | 041-2271128 | පේදුරුතුඩුව | 021-2260212 |
| ඇඹිලිපිටිය | 047-2230299 | පොල්ගහවෙල | 037-2243039 |
| ගල්ගමුව | 037-2253290 | පොළොන්නරුව | 027-2226572 |
| ගාල්ල | 091-2226124 | පොතුවිල් | 063-2248485 |
| ගම්පහ | 033-2248804 | පුගොඩ | 011-2405333 |
| හම්බන්තොට | 047-2221092 | රත්නපුර | 045-2226899 |
| හැටන් | 051-2222390 | තංගල්ල | 047-2240122 |
| හිඟුරක්ගොඩ | 027-2245521 | තඹුත්තේගම | 025-2276259 |
| හෝමාගම | 011-2748813 | තිස්සමහාරාමය | 047-2239611 |
| හොරණ | 034-2265244 | ත්‍රිකුණාමලය | 026-2226328 |
| යාපනය | 021-2224545 | වාලච්චේනයි | 065-2258349 |
| කඩවත | 011-2922440 | වව්නියාව | 024-2221863 |
| කඩුවෙල | 011-2548150 | වලස්මුල්ල | 047-2245566 |
| කැකිරාව | 025-2263536 | වැල්ලවාය | 055-2274466 |
| කල්මුනේ | 067-2223710 | වරකාපොළ | 037-2277075 |
| කළුතර | 034-2222017 | වාරියපොල | 037-2268199 |
| මහනුවර | 081-2388978 | වැලිමඩ | 057-2244860 |
| කන්තලේ | 026-2234521 | මල්ලකම් | 021-2059170 |
| කැබිතිගොල්ලැව | 025-2298101 | පුත්තලම් | 032-2266636 |
| කෑගල්ල | 035-2231790 | සියඹලාණ්ඩුව | 055-2279250 |
| කිලිනොච්චි | 021-2285618 | දෙහිඅත්තකණ්ඩිය | 027-2250700 |
| කුලියාපිටිය | 037-2284611 | LT-බොරැල්ල | 011-2698003 |
| කුරුණෑගල | 037-2229641 | ගලගෙදර | 081-2061025 |
| මහියංගනය | 055-2258332 | වත්තල | 011-2935907 |
| මාහෝ | 037-2275075 | හෙට්ටිපොල | 037-2291915 |

**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව**

නො.129, මහාධිකරණ සංකීර්ණය,
හල්ෆ්ට්ස්ඩෝර්ප් වීදිය, කොළඹ 12.

011 2433618

legalaidcommission1978@gmail.com

www.legalaid.gov.lk

